## රබර් පාලන අරමුදල

------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මතය

--------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රබර් පාලන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) භෞතිකව නොපවත්නා පිරිවැය රු.985,925 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයෙදී රු.1,370 ක ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) රු.7,000,000 ක් වූ තැන්පතු සඳහා ලැබී තිබූ ආයෝජන පොළී ආදායම් ගිණුම් ගතකර නොතිබණි.

මෙම පොළී ආදායම පාලන ගිණුම තුල තැන්පත් කිරීමෙන් ඵලදායී ලෙස ප්‍රයෝජනයක් ලද නොහැකි බැවින්, අදාළ පොළී ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයට දායක කරගන්නා ලද බව අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත දන්වා තිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.635,271 ක් වූ ජංගම වත්කම් විෂයයන් 13 ක ශේෂ වර්ෂ 07 කට වැඩි කාලයක සිට දිගින් දිගටම ලැබිය යුතු ශේෂ ලෙස ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ආ) එකතුව රු.239,784 ක් වූ ජංගම බැරකම් විෂයයන් 05 ක වර්ෂ 07 කට වැඩි කාලයක සිට ගෙවිය යුතු ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

1.2.3 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම.

-------------------------------------------

පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවිණි.

| | විෂයය | මුදල<br>රු. | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 | අරමුදලට අයත් ස්ථාවර වතක්ම් ලේඛනය, මූලාශ්‍ර ලියවිලි, සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) | ණය සහන සහා අරමුදල | 130,328 | විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් |
| (ඇ) | අත්තිකාරම් ගිණුම් 6 කට අදාල ශේෂ | 287,378 | විස්තරාත්මක උපලේඛන , ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | රබර් වෙළඳ ලේඛන තොග | 6,360 | තොග ලේඛන |
| (ඉ) | වෙනත් ජංගම වත්කම් | 746 | ශේෂ සනාථ කිරීම් |
| (ඊ) | ගෙවිය යුතු අත්තිකාරම් | 222,031 | විස්තරාත්මක උපලේඛන,ශේෂ සනාථ කිරීම් |
| (උ) | අනෙකුත් ජංගම වගකීම් | 17,753 | ශේෂ සනාථ කිරීම් |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.275,280 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ එය 275,865 ක් වූයෙන් අතිරික්තයෙ අඩුවීම රු.585 ක් විය. කෙසේ වෙතත්, අරමුදලේ මුළු මෙහෙයුම් ආදායම ආයෝජන පොලී ආදායමෙන් පමණක් සමන්විත වූ අතර එය රු. 301,650 ක් විය.

2.2 මෙහෙයුම් සමාලෝචනය

2.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

ක්‍රියාකාරත්වයේ නොපවතින රබර් පාලන අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර එයට විගණකාධිපතිගේ එකඟතාවය ලබා ගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3 අයවැය ලේඛනමය පාලනය

රබර් පාලන අරමුදල යටතේ වාර්ෂිකව වියදම් දැරීමක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

3. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම